අවිවාහක කාන්තාවන් සිටිනා නිවෙස් වල ඇඳන් යට සැඟවී ඔවුන්ට ලිංගික අතවර කරන්නට තැත් කළ පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් පුවතක් දිවයින හා අරුණ පුවත්පත් තුළ (03/15) පළවී තිබිණි. මෙහිදී දිවයින සිරස්තලයේ සඳහන්ව තිබුණේ "රැට රැට ඇඳන් යට රිංගන අනංගයාට වෙච්ච දෙයක්" යනුවෙනි. අරුණ සිරස්තලයේ "ඇඳන් යට සැඟව සිට අවිවාහක කතුන්ට අතවර කළ සල්ලාලයා කොටු" යනුවෙන් සඳහන්ව තිබිණි.

ලිංගික අපරාධයක් කිරීමට තැත් කිරීමක් වුවත් නීතියෙන් දඬුවම් ලැබෙනා වරදක් බව නොකිවමනායි. එවන් පසුතලයකදී, මෙම සිදුවීම හෝ එහි සැකකරු රොමාන්තීකරණය කරමින්, සැබෑ අපරාධයේ ස්වභාවය සැහැල්ලු කිරීම කිසිසේත්ම පිළිගත හැකි මාධ්‍ය භාවිතාවක් නොවේ.

ඒ අනුව, ඔබ තෝරාගන්නේ කුමන සිරස්තලයද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Aruna